# වාරිමාර්ග දෙපාර්තමේන්තුව

# ඇබෑර්තු

## මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)

## අරමුදල් සැපයීම් ප්‍රභවය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යනු, වාරිමාර්ග අමාත්‍යාංශය විසින්, ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) සහන ණය අරමුදල් පහසුකම් යටතේ ශ්‍රී ලංකා රජයේද සහභාගිත්වයෙන්, ක්‍රියාත්මක කරනු ලබන, 2024 වර්ෂයේදී සම්පූර්ණ කිරීමට නියමිත මහවැලි බහුකාර්ය සංවර්ධන වැඩසටහනේ ප්‍රධාන සැලසුම් කොටසක් වේ.

**අයදුම්පත් :**

පහත සඳහන් තනතුර කොන්ත්‍රාත් පදනමින් පිරවීම සඳහා, යථාපරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලබන අතර, අයදුම්කරුවන් විසින්, තම අයදුම්පත්, සම්පූර්ණ ජීවදත්ත සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ඇමතුම් අංක සහිතව අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ආදී මූලික සුදුසුකම් සහතිකවල පිටපත් සමග, ලියාපදිංචි තැපෑලෙන් **2023 අප්‍රේල් 10 වන දිනට පෙර, වැඩසටහන් අධ්‍යක්ෂ, මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන, අංක 493 – 1–1, ටී.බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.**

කරුණාකර, අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කරන්න. එයට අමතරව, එම අයදුම්පතෙහිම සෘජු පිටපතක්, pdadbproject@gmail.com වෙත, hr.mwsip@gmail.com වෙත පිටපත් කොට, අදාළ ඊමේල් විෂය තීරුවේ අයදුම් කරන තනතුර සඳහන් කොට ඉදිරිපත් කරන ලෙසට අයදුම්කරුවන් වෙතින් ඉල්ලීමක් කෙරේ.

| තනතුරු හා රැකියා විස්තරය | සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|
| **1. මූල්‍ය කළමනාකරු (PS 03) වැඩසටහන් කළමනාකරණ ඒකකය - කොළඹ**<br>**තනතුරු 01 යි.**<br>**රැකියා විස්තරය :**<br>වැඩසටහන් මූල්‍ය හා ගිණුම්කරණ පද්ධති සකස් කොට පවත්වාගෙන යාම, සැලසුම්, අයවැය සකස් කිරීම, අරමුදල් ලබාගැනීම, බැංකු ගිණුම්, ලෙජර් නඩත්තු කිරීම, ගෙවීම් හා අභ්‍යන්තර පාලනය, මූල්‍ය වාර්තා සහ ප්‍රතිපූර්ණ ලේඛන සකස් කිරීම, ගබඩා කළමනාකරණ ක්‍රියාපටිපාටිය<br>සත්‍යාක්ෂණය හා විගණන වාර්තා සහ වෙනත් ඕනෑම මූල්‍ය විෂයයට සම්බන්ධ, වැඩසටහන් අධ්‍යක්ෂවරයා හට සමස්ත කළමනාකාරිත්වයට හා මූල්‍ය අංශයට අවශ්‍ය පැවරුම් සකස් කිරීම. | පහතින් දක්වා ඇති සුදුසුකම්, පළපුරුද්ද හා වැටුප් තල, අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව වේ.<br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම.<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ, උපාධියට සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් සුදුසුකම්<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්,<br>**සමග**<br>අවම වශයෙන් වසර 14 ක කළමනාකරණ තලයේ, සුදුසුකම් ලබා ගැනීමෙන් පසු පළපුරුද්ද.<br>2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කොට තිබීම.<br>**හෝ**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්,<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්,<br>**සමග**<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සහ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන වෘත්තීය සුදුසුකම්,<br>**සමග**<br>අවම වසර 10 ක කළමනාකරණ තලයේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.<br>3. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 1 ශ්‍රේණිය නිලධාරියකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම්<br>**සමග**<br>1. පංතිය තනතුරක අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද.<br>(වැටුප් තලය : PS–3– රුපියල් 180,000.00 රුපියල් 195,000.00) |

- MSD චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව, ඉහතින් නිර්දිෂ්ඨ වැටුප්වලට අමතරව ජීවන වියදම් අංක දීමනාවද ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි :**

1. අයදුම්කරුවන්, වයස අවුරුදු 64 ට අඩු අය විය යුතුය.
2. සියලුම නිලධාරින්, තමන්ගේ රාජකාරි, අදාළ රජයේ සංවිධාන හා වෙනත් නියෝජිතායතන සමග සම්බන්ධීකරණයෙන් හා සහයෝගීතාවයෙන් සිදු කිරීම අපේක්ෂා කෙරේ.
3. ශ්‍රී ලංකාවේ සිදුකළ විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල සේවය කොට පළපුරුද්දක් තිබීම අමතර වාසිදයක වනු ඇත.
4. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය, රජයේ රෙගුලාසි පිළිබඳ හුරුපුරුදුතාවය හා පරිගණක සාක්ෂරතාවය මෙම තනතුරු සඳහා පූර්ව සුදුසුකම් වේ.
5. සේවා කොන්ත්‍රාත්තුව එක් වසරක් සඳහා වන අතර, කාර්යසාධනය හා වැඩසටහන්වල හා ව්‍යාපෘතිවල අවශ්‍යතාවය මත වාර්ෂිකව දීර්ඝ කළ හැකිය.
6. රජයේ අනුමත වැටුප් පරිමාණයන් සහ දීමනා, අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හා ඉන් පසු සිදුකළ සංශෝධන ප්‍රකාරව වේ. (http://www.treasury.gov.lk)
7. නියමිත රාජකාරි වේලාවෙන් පසුව හා සති අන්ත දිනවල සේවය කිරීමේ හැකියාව.

ඉහළම සුදුසුකම්ලත් හා පළපුරුද්ද සහිත අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කොට සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අතර, සුදුසුකම් මත තෝරා ගැනීම සිදුකෙරේ. එසේ හෙයින්, බඳවා ගැනීමේ ක්‍රමවේදයට බලපෑම් සිදුකිරීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවිය හැක. රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත මණ්ඩල / සංස්ථාවල සහ අනෙකුත් රජයේ ආයතනවල අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතු අතර, ඔවුන් විසින්, අදාළ අයදුම්කරු, මෙම තනතුරට තෝරාගනු ලැබුවහොත් අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 2.3.3 (බී) ඡේදය ප්‍රකාරව, දැනට දරන තනතුරෙන් පූර්ණ කාලීනව – වැටුප් රහිතව නිදහස් කළ හැකිද යන්න සඳහන් කළ යුතුය. ඉහත අවශ්‍යතා සහිතව යථා පරිදි නොපිරවූ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**ලේකම්,**
**වාරිමාර්ග අමාත්‍යාංශය.**